# ටිෂාගේ අරුම

# පුදුම දේවල්

# පෙරවදන

මාගේ මෙම විද්‍යුත් පොත  දළදා වහන්සේට සෙනෙහෙබරින් පුදනු ලැබේ.

# පසුවදන

අප ඉදිරියේ ඇත්තේ ඩිජිටල් සමාජයකි.එහිදී මුහුණදීමට සිදුවන නව අභියෝග හඳුනා ගැනීමටත්, ඒවාට මුහුණ දීමටත් අවැසි අවබෝධය ලබා ගැනීමටත් ඔබට මෙම පොත සහාය වනු ඇත.ළමා කාලය ඵලදායිව ගත කිරීමටත් මෙම පොත  ප්‍රයෝජනවත් වේ. අනෙකුත් ඉගෙනුම් හැකියාවන් වෙත ළඟාවන්න දොරටු විවෘත කරගැනීමට ඔබ මෙම පොත කියවන්නයි ආදරයෙන් ඉල්ලා සිටිමි.

# පටුන


- ටීෂා
- ටීෂා සහ කුරුමිට්ටෝ
- ටීෂා සහ අරුම පුදුම ගස
- ටීෂා ගතකරපු සුන්දර රාත්‍රිය
- ටීෂා සහ පරණ රාජමාලිගාව
- ටීෂා සහ අරුම පුදුම පොත
- ටීෂා සහ මායා කැඩපත
- ටීෂා සහ තවත් කෙනෙක්
- ටීෂා සහ නත්තල් තැග්ග
- ටීෂා සහ කුමාරයා

# ටීෂා

ටීෂා කියන්නේ ගොඩක් යහපුරුදු දන්න හොඳ ළමයෙක් . මෙයාට හොඳ අම්මයි තාත්තයි කෙනෙකුත් ඉන්නවා . එහෙත් එක දවසක් මේ ටිෂාගේ අම්මා මිය ගියා. ටීෂා හොඳටම ඇඩුවා. ටීෂා හිතුවා මම මෙහෙම අඩලා හරියන්නෑ. මම හොඳට පාඩම් කරලා විභාග හොඳින් ජය ගන්න ඕනේ කියලා. ටීෂා හොඳට පාඩම් කරා. මේ ටීෂාට අම්මා නැති උනාට පස්සේ තාත්තා තවත් විවාහයක් කරගත්තා. ඉතින් මේ කුඩම්මා ටීෂාට මුල්ම කාලේ හොඳට ආදරෙන් හිටියා. ඉතින් මේ කුඩම්මට තව ළමයෙක් හම්බ වුණා . ඉතින් මේ කුඩම්මා ටීෂාට නරක විදිහට සැලකුවා. තාත්තත් වැඩට යනවා.මේ ටීෂාට හරියට කන්න හම්බුනෙත් නැහැ.පවුලේ කට්ටිය කාලා ඉතුරුන ඒවා විතරයි මේ ටීෂාට කන්න හම්බුනේ.ටීෂාට ගෙදර පොලේ වැඩ කරන්නයි පස්සේ අතුගාන්නයි අස් කරන්නයි එයාට ඔක්කොම බාර දීලයි තිබුනේ.ඉතින් මේ ටීෂා දවසක් හොඳටම ඇඩුවා. ඉතින් මෙහෙම අඩ අඩා ඉද්දි ටීෂාගාවට එක පාරටම සුරංගනාවියක් ආවා. ඉතින් මේ සුරංගනාවිය ටීෂාගේන් ඇහුවා ඇයි අඩන්නේ කියලා . ඉතින් ටීෂා මෙහෙම කිව්වා.බලන්නකො සුරංගනාවිය, මට ගෙදර පොළ අස් කරන්නයි අතු ගාන්නයි තියෙනව. හරියට කන්න ලැබෙන්නෙත් නෑ කියලා ටීෂා හොඳටම ඇඩුවා. මේ සුරංගනාවිය ටීෂාට පහනක් දීලා යන්න ගියා . මේ සුරංගනාවේ කිව්වා ඒ පහන පිරිමැදීමේදී මම ඔයා ගාවට එනවා කියලා..



# ටීෂා සහ කුරුමිට්ටෝ

ටීෂා ගෙදර අත්හැරලා යන්න ගියානේ. ඉතින් මෙයා ඔහොම යනකොට ගුහාවකට වැටුනා.ඉතින් මේ ගුහාවට වැටිලා ඔහොම දිගටම ඇවිදගෙන ගියා.එහෙම යනකොට ටීෂාට ලස්සන වනාන්තරයක් හම්බුනා. එයා දැක්කා ලස්සන ලස්සන සමනලුන් පැන පැන යන හාවුන් කුරුල්ලන් පියාඹගෙන යනවා.ටීෂාට අදහගන්නත් බැරිවුනා. ටීෂාට හරිම සතුටුයි.ඉතින් මේ ලස්සන වනාන්තරේ සුන්දර දැක දැක ඉද්දි එක පාරටම කවුදෝ කතා කරන සද්දයක් ඇහුනා. ටීෂා බැලුවා කවුද මේ කතා කරන්නේ කියලා. ටීෂාට පොඩි බයක් දැනුනා. එතකොට කවුද එතෙන්ට ඇවිල්ලා කිව්වා බය වෙන්න එපා ළමයෝ බය වෙන්න එපා ළමයෝ කියලා. එතනින් එළියට ආවෙ කුරුමිට්ටෝ ටිකක්.ඉතින් මේ කුරුමිට්ටෝ ඇහුවා ඔයා කවුද? ඇයි මෙහාට ආවේ කියලා. මම මගේ ගෙදර අත් හැරලා ආවා. මම කැලේ  අතරමං වුණා. ඊට පස්සෙ ඔහොම ඇවිදගෙන එද්දි මම ගුහාවකට වැටුණා.ඊට පස්සේ තව ටිකක් ඇවිදං එද්දි තමයි මට මේ වනාන්තරේ හම්බවුනේ කියලා ටීෂා කිව්වා. ඉතින් මෙහෙම වැඩි කතාව බහෙන් පස්සේ මේ කට්ටිය යාළු උනා.ටීෂා කිව්වා දැම්මට යන්න ඕනේ කියලා.ටීෂාට කට්ටියක් දාලා යන්නත් දුකයි. කට්ටියට ටීෂාව දාලා යන්නත් දුකයි.  කරන්න දෙයක් නැති හින්දම ටීෂා යන්න හැදුවා.ටීෂා පහන පිළිමැදල සුරංගනාවියට කතා කරලා ආයෙත් යන්න ගියා.



# ටීෂා සහ අරුම පුදුම ගස

ඉතින් අර කට්ටියට සමුදීල ටීෂා ගියානේ. දැන් ටීෂාට හරිම මහන්සි.විවේකයක් ගන්න ඕනේ කියලා ටීෂාට හිතුනා. ඒක හින්දා ටීෂා ගහක් යට නින්දට වැටුනා. ටීෂාට නින්දෙන් ඇහුනා කවුදෝ කතා කරන සද්දයක්.ටීෂා හැරිලා බැලුවා. ඒත් එතන කවුරුත් හිටියේ නෑ. ටීෂා හැමතැනම බැලුවා ඊට පස්සේ උඩ බැලුවා. ටීෂාට හරිම පුදුමයි. ටීෂා නිදාගෙන ඉන්න ගස කතා කරනවා.ගස ඇහුවා ඔයා කවුද? ඔයා ඇයි මෙහාට ආවේ කියලා.ටීෂා කිව්වා මම ගෙදර අත්හැරලා ආවා. අත්හැල්ලාවට පස්සේ මම ගුහාවකට වැටුණා. ගුහාවකට වැටුනාට පස්සේ මම ටිකක් ඇවිදං යද්දි මට කුරුමිට්ටෝ ටිකක් හම්බුනා. ඊට පස්සේ මට මහන්සියක් දැනුනා. ඊට පස්සේ තමයි මං මෙතනට ආවේ කියලා. මේ අරුම පුදුම ගස කිව්වා ආ ළමයෝ ඔයාටත් මේ පලතුරක්. ටීෂා ඒක සතුටින් ගත්තා.මේ අරුම පුදුම ගස කිව්වා. අනේ , බලන්නකෝ අපේ වනාන්තරයට ඉඩෝරයක් ආවා. ඉතින් ඉඩොරෙන් මේ මම වේලිලයි තියෙන්නේ. මම තමයි මේ වනාන්තරේටම තියෙන්නේ. අනේ ටීෂා ඒක නිසා මට වතුර ටිකක් ගේන්න පුළුවන්ද කියලා. ටීෂා හරිම කරුණාවන්තයිනේ ඒක හින්දා ටීෂා මේ අරුම පුදුම ගසට වතුර ගෙනත් දැම්මා.ඉතින් මේ දෙන්නා යාළු උනා. ටීෂා කිව්වා දැම්මට යන්න වෙලාව හරි . මම යනවා කියලා අරුම පුදුම ගසට සමුදයලා අර පහනක් පිරිමැදිලා සුරංගනාවියට කතා කරලා යන්න ගියා.



# ටීෂා ගතකරපු සුන්දර රාත්‍රිය

ටීෂා ඔහේ ඇවිදගෙන යනවා. එයාට කාගේද ශබ්දයක් ඇසෙනවා. ඒ ශබ්දයාවේ ගෝනෙක්ගේ ශබ්දයක් වගේ. එයා මාව බේරගන්න බේරගන්න කියලා කෑ ගහනවා.ටීෂා කොහොමත් හරිම කරුණාවන්ත ගෑණු ළමයෙක්නේ. ඒක නිසා මෙයා ටක් ගාලා දුවලා ගියා.බලද්දි මේ ගෝනා මඩකට වැටිලා හිරවෙලා. ටීෂාට හරිම දුකයි.ටීෂා හිතුවා මං මේ ගෝනව කොහොමහරි බේරගන්නවා කියලා.එයා ලණුවක් කැරගෙන ඇවිල්ලා මේ ගෝනාට අල්ල අල්ලගන්න කියලා ගෝනව කොහොම හරි අමාරුවෙන් ඇද්දා. ටීෂටත් සතුටුයි ගෝනටත් සතුටුයි.ගෝනයි ටීෂයි යාලු උනා.ගෝන කිව්වා ඔයාට උදවුවක් අවශ්‍ය නම් කෑ ගහන්න කියලා. ඉතින් මේ ගෝනා ස්තූති කරලා යන්න ගියා. දැන් ඉතින් ටීෂා තවත් ඇවිදගෙන යනවා.එයාට තව සද්දයක් ඇහුනා මාව බේරගන්න කියලා. එයා ආයේ එතනට ඉක්මනින් දුවගෙන ගියා.එයා දැක්කා කොටයක් අස්සේ හිර වෙලා ඉන්න අලියෙක්.එයාට දුක හිතුනා. ඒක නිසා ආයෙත් ටීෂා මේ කොටේ කොහොම හරි අයින් කරලා මේ අලියව ගොඩට ගත්තා. ඉතින් මේ අලියා ගොඩාක් ස්තුතියි කරාමේ ටීෂාට . අලියා කිව්ව ඔයාට කරදරයක් වුණොත් ඔයා කෑ ගහන්න මං එතෙන්ට අනිවාර්යෙන් එනවා කියලා. ඉතින් මේ ටීෂා තව මේ වනාන්තර ඉන්න සත්තු ගොඩක් ට උදව් කරා. දැන් රෑ වේගෙනත් එනවා. ටීෂා ගිනි මැලයක් ගහගත්තා. එයාට වුට්ටක් බයකුත් දැනුනා. ඒත් එයා හිතුවා මට කැලේ යාළුවො ඉන්නවනේ එයාලා මොනවා හරි ප්‍රශ්නයක් වුණොත් උදව් කරයි කියලා. ඉතින් එහෙම හිත හිතා ටීෂාට නින්ද ගියා. දැන් රෑ වෙලා. නිකන් ටීෂාට කවුරුහරි ගොරවන සද්දයක් ඇහුණා. එයා ඇහැලා බලද්දි ඒ සිංහ රැලක්. ටීෂා මා හඬින් කෑ ගැහුවා. ඉතින් අර උදව් කරපු වනාන්තර හැම සතෙක්ම මේ ටීෂාගේ සද්ද ඇහිලා එතෙන්ට ආවා.ඒ සතුන් ටීෂාට උදව් කරා. කොහොම හරි අර සිංහ රැල ටීෂයි ටීෂාගේ යාලුවොයි පන්නලා දැම්මා.ඉතින් මේ කට්ටිය කතා කර කර හිටියා. මෙයාලට එක එක හිනා යන කතා කිව්වා. ටීෂා කිව්වා මේ ගත කරපු සුන්දර රාත්‍රිය නම් මට කවදාවත් අමතක වෙන්නේ නෑ කියලා.



# ටීෂා සහ පරණ රාජමාලිගාව

ටීෂා ඔහොම දිගටම ඇවිදගෙන ගියා. ටීෂා ගොඩක් කැමති පරණ දේවල් වලට. ටීෂා ඔහොම යද්දි එක පාරටම ගස්වැල් වලින් වැහී තියෙන අමුතු පරණම මාලිගාවත් තිබුණා. ටීෂා එඩිතරවම ඒ මාලිගාවට ගියා. ඒ මාලිගාවට තට්ටු කළා. ඒත් එතන කවුරුත් හිටින ඒක හින්දා ටීෂා එක දිගට ඇවිදගෙන ගියා. ඒ මාලිගාව ගොඩාක් ලස්සනයි.සමහර බඳුන් රත්තරන් වලින් තමයි හදලා තිබුණේ. ඉතින් එයාට හිතුනා කවුරුහරි මගේ පස්සෙන් එනවා වගේ කියලා. ටීෂා පිටිපස්ස බැලුවා. ඒත් කවුරුත් හිටියේ නෑ. ආයෙත් ඉස්සරහ බලද්දි එතන හිටියා පිරිමි කෙනෙකුයි ගෑනු කෙනෙකුයි. එයාලා හොල්මන්. ටීෂා ගොඩාක් බය උනා. ඊට පස්සේ මේ ගෑනු කෙනයි මේ පිරිමි කෙනයි කිව්වා බය වෙන්න එපා ළමයෝ කියලා. ඊට පස්සේ මේ ටීෂා ඇහුවා ඔයාල කවුද ඔයාලගෙ ද මේ රාජ්‍යමාලිගාව  කියලා. ඊට පස්සේ මේ හොල්මන් කිව්වා ඔව් මේ අපේ රාජමාලිගාව . අපිට එක මන්තරකාරියක් ශාපයක් කරල තමයි ඉන්නේ. ඒ ශාපෙන් අපේ අම්මයි තාත්තයි මිය ගියා. ඉතින් මේ වෙලාවේ මෙහෙම හරි අපි දෙන්නා විතරයි ඉතිරිලා ඉන්නේ හොල්මන් විදිහටවත් කියලා. ඊට පස්සේ මේ ටීෂා කතා කර කර හිටියා.මේ ටීෂා ඇහුවා ඔයාලව බේරගන්න මොකක්ද තියෙන ක්‍රමයක් කියලා. ඉතින් මේ හොල්මන් ටික කිව්වා . අපි බේරගන්න එකම එක ක්‍රමයයි තියෙන්නේ කියලා. ටීෂා ඒ මොකක්ද? කියලා ඇහුවා. එයාලා කිව්වා මෙහෙමයි. අර දුෂ්කර කඳුකරේ තියෙනවා නේද ? ඒකෙ ඉන්නවා කොටියො වලස්සු එයාලව කොහොම හරි පරද්දන්න ඕන. එතන මැණිකක් තියෙනවා. ඒ මැණික අරගෙන ඒක එළියක් තියෙනවා. ඒ එළිය අපේ ඇස් දෙකට පෙන්නන්නට ඕනේ. ඊට පස්සේ තමයි අපි තිබ්බ විදියටම මේ අපි බේරෙන්නෙ කියලා. ටීෂා හරි සතුටින් ඒ ගමන යන්න පිටත් වුනා.අර හොල්මන් ටික එයාලට බීජ ටිකක් අතට දුන්නා. ඒ කට්ටිය කිව්වා මේ බීජ ඔයාලට කරදර උනොත් බේරෙන්න පුළුවන් මේ බීජ ඒ කරදරේ ගාවට දාන්න ඕනේ. එතකොට එයා නැත්තටම නැති වෙනවා කියලා. ටීෂා ගමන යන්න සූදානම් වුණා. පළවෙනිමටම ටිෂාට තිබ්බේ.



# ටීෂා සහ අරුම පුදුම පොත

ටීෂා ඔහොම එක දිගට ඇවිදගෙන ගියා. එකපාරටම ටීෂා වලකට වැටුනා. එතන තිබ්බා අරුම පුදුම පොතක්. ටීෂා ඒක එක පාරට අතගෑවා. එතකොට ටීෂා කොහෙදෝ කැරකිලා කැරකිලා යනවා වගේ දැනුනා. එකපාරටම ටීෂා වැටුණේ ඊජිප්තුවට. ටීෂාට දැනුනා මං ඉතිහාසයට ගිහින් වගේ. ඉතින් ඒකෙ තිබුණා ඊජිප්තු පිරමීඩය, පාරාවන් රජ පවුල්ලන්ගේ පින්තූර, තව ලස්සන ලස්සන විවිධ නිර්මාණත් එහි තිබුණා. එකපාරටම ඊජිප්තුවේ හිටපු මනුස්සයෙක් ටීෂාට කතා කරා. ඉතින් මේ ටීෂාට ඉබේටම මේ මනුස්සයත් එක්ක කතා කරන්නට පුළුවන් වුණා. ටීෂාට පුදුමයි. ඉතින් මේ ටීෂා එහෙත් එන ආහාරපාන රස විඳිමින් එයාලත් එක්ක සතුටින් කතා කරා. ඉතින් ඊට පස්සේ ටීෂා එකපාරටම අතුරුදහන් වුණා. ඊට පස්සේ ටීෂා ග්‍රීසියට වැටුණා. ග්‍රීසියේ අය එක්කත් සතුටින් කාලේ ගත කරා. ඊට පස්සේ ටීෂා ආයිත්තේ කැලෑවට ආවා. කැලෑව සත්තුන්ට මේ ගැන කිව්වා. එයාලා මේ ගැන විශ්වාස කරේ නැහැ. ඊට පස්සේ මේ ඉතිහාසය ගැන තොරතුරු මේ සද්දුන්ට සතුටින් කියල දුන්නා. ඒ ගමනේදී ටීෂාට ගොඩාක් ඉතිහාසයේ තොරතුරුත් දැනගන්නට ලැබුණා.



# ටීෂා සහ මායා කැඩපත

ටීෂාට මේ කැලේ දැන්නම් පැටලිලයි තියෙන්නේ. ඉතින් මේ ටීෂා එක දිගට ඇවිදගෙන ගියා. එතකොට එයා ගාවට  ආවා වයස්ගත මායාකාරියක්. ඒ මායාකාරිය කිව්වා අරෙහා කැලේ තියෙන පලතුරු ටික මට ගෙනත් දෙන්න පුළුවන්ද කියලා. ටීෂා කියන්නෙ නැතුවම ඒ පළතුරු ටික කඩාගෙන ඇවිල්ලා මේ මායාකාරයට ගෙනත් දුන්නා. ඉතින් මේ මායාකාරිය ටීෂාට මායාකාර කැඩපතක් ලබා දුන්නා. ඉතින් මේ කැඩපතෙන් කියවෙන්නේ අනාගත සැමියා ගැන. ඉතින් මේ ටීෂා එයාගේත් අනාගත සැමියා බලන්න මේ කැඩපත පිරිමැදුවා. එතකොට දැක්කා ටීෂා ලස්සන කඩවසම් කුමාරයෙක්. ටීෂාට අඳාගන්න බැරිවෙනවා. ටීෂා මුකුත් කතා කරන්නැතුවම මේ කුමාරයා හොයන්න යන්න ගියා. ඉතින් මෙහෙම යද්දි ගොඩක් කට්ටිය රැස්වෙලා ඉන්න තැනක් දැක්කා. ඉතින් මේක තරඟයක්. ඉතින් මේක අදියර දෙකකින් සමන්විතයි කියලා මේ විනිශ්චකරු කිව්වා. ටීෂා එඩිතරව මේකට බය නැතුව මුහුණ දුන්නා. මේකෙ තිබ්බේ මොලේ කල්පනා කරලා පෙහෙළිකා විසඳන්න. ඉතින් මේ ටීෂා හරිම බුද්ධිමත් හින්දා පළවෙනි ආදියර  ජයග්‍රහණය කරා. ඉතින් අන්තිම වටේ තිබ්බේ පිසීමේ තරගයක්. ඒකෙ තිබ්බේ සහායකයෙකුයි සහකාරියකුයි රසට පිසීමේ තරගයක්. ඉතින් මේකේ රසටම හදන කට්ටියට ත්‍යාග ලබා දෙනවා. ටීෂා පළවෙනි වටේ ජයග්‍රහණය කරපු හින්දා ලේසියෙන් ඇතුල්වෙන්නට පුළුවන් වුණා. ඉතින් මේ ටීෂාට සහකාරයෙක් ලැබුණා. එයා හරියට අර කැඩපතේ හිටපු කුමාරයා වගේමයි. ඉතින් මේ දෙන්නා එකතු වෙලා ලස්සට කෑම ඉව්වා. ඉතින් මේ දෙන්නා තරඟය ජයග්‍රහණය කරා. ඉතින් මේ කුමාරයා ගන්න සේවකයන් පිරිසක් ආවා. දෙන්නට දෙන්නා මූණ බලාගෙන කුමාරයා කරත්තේ නැගලා යන්න ගියා. ටීෂා ඒ කුමාරයාට වශී වුණා.



# ටීෂා සහ තවත් කෙනෙක්

ටීෂා ඔහොම කැලේ ඇවිදගෙන යද්දී එකපාරටම වෙස්වලා ගත්ත ගැහැණු ළමයෙක් ටීෂාගේ පැත්තට එනවා ටීෂා දැක්කා. ඊට පස්සේ ඒ ගැහැණු ළමයා  ටීෂගේ පිටුපස හැංගුනා. ඊට පස්සේ ටීෂා  ඉක්මනින් ඇහුවා ඇයි ඔයා හැංගෙන්න කියලා. අර ගැහැණු ළමයා කිව්වා හොරුකණ්ඩායමක් එනවා අපි ඉක්මනින් දුවමු කියලා. ඉතින් මේ ටීෂා හැංහුනේ වලස් ගුවාවක. ඉතින් මේ ටිෂයි, ගැහැණු ළමයයි වලස් ගුහාව ගාවට ගියා. ඊට පස්සේ ඉතින් එතන හිටියේ වලසෙකුනේ . හොරුකණ්ඩායම දැක්කේ වාලෙහෙක් කියලා. ඉතින් අර  ගැහැණු ළමයා මේ වලසුන් කාල  කියලා හිත හදාගෙන යන්න ගියා. ඉතින් අර ගැහැණු ළමයා මේ   වලහට බය වුණා. ටීෂා කිව්වා දුවන්නට එපා. මේ මගේ යාළුවා මේ වනාන්තරේ ඉන්න හැම කෙනෙක්වම මම දන්නවා. මායාකාරියෝ ,සත්තු ,ගස් වර්ග මම දන්නවා. ටීෂා ඇහුවා ඔයා කවුද කියලා?

ඉතින් මේ ගැහැණු ළමයා කිව්වා .මම  අපේ  ගමේ ඉද්දි හොරකණ්ඩායමක් ඇවිල්ලා මගේ පිටිපස්සෙන් පැන්නුවා. ඊට පස්සේ මං දන්නෙම නැතුව තමයි මේ වනාන්තරයට ආවෙ. ඊට පස්සේ මේ ගැණු ළමයා ඒ වෙස්වලා ගත්ත ඇඳුම ගැලෙව්වා. ටීෂාටයි ගැහැණු ළමයාටයි  අදහගන්න බැරි උනා. එහේ ගැහැණු ළමයටයි ටීෂයි එකම වගේ.ටීෂා  ඇහුවා ඔයා මමද? කියලා. ඒ ගැහැණු ළමය ඇහුවා ඔයා මමද? කියලා. මේ දෙන්නට හිතාගන්නට බැරි උනා. ඊට පස්සේ මේ ටීෂා, ටීෂා  ඉන්න කැලේ පෙන්නුවා. ඉතින් මේ ගැහැණු ළමයත් ගහකට නැගලා එයාලගේ ගම පෙන්නුවා.ටීෂාට හිතනා ඒ ගමට යන්න. මේ ගැහැණු ළමයාට හිතුනා සත්තුත් එක්ක වනාන්තරේ වාසය කරන්න. එහෙම බෑනේ කියලා අම්මලත් හොයනවා ඇති කියලා හිතලා  මේ ගැහැණු ළමයා සමුදීල යන්න ගියා. දෙන්නට දෙන්න පොරොන්දු වුනා කවදාවත් අමතක කරන්නේ නෑ කියලා.



# ටීෂා සහ නත්තල් තෑග්ග

දැන් මේ නත්තල් සමය. එහෙ නත්තල් උත්සවාකාරයෙන් සමරනවා.ටීෂාට අර කුමාරයාව මතක් උනා. ටීෂා අර කැඩපතෙන් කුමාරයාගේ මූණ දිහා බල බලා මතක් කරා .දැන් ටීෂා ලොකු ළමයෙක්. එයා හිතුවා දැන්නම් මට මේ කැලේ ඇතිවෙලයි තියෙන්නේ කියලා. එයාට දැන් කලින් හිටපු ගෙදර මතක් වෙනවා. ඉතින් එයා හිතුවා මේ වනාන්තර නැතුව මට ඕන තැනක් හම්බවෙන්නේ කියලා. ඉතින් ඔහොම මතක් කර කර ඉද්දි එක පාරටම කවුද උඩින් එනවා වගේ දැක්කා.එයා එනවා දැක්කේ නත්තල් කරත්තයකින්. එයා මේ වනාන්තරයට එනවා වගේ දැක්කා. ඉතින් එයා නත්තල් කරත්තෙන් බැහැලා එක පාරටම ටීෂා ගාවට මතුවුනා. ටීෂා බලද්දි ඒ නත්තල් සීයා. ටීෂාට හරිම සතුටුයි. නත්තල් සිය ඇහුවා මොකද ළමයා ඔය දුකින් ඉන්නේ කියලා. ටීෂා කිව්වා අනේ බලන්නකෝ නත්තල් සීයේ දැන් මම දවස් ගානක් මේ වනාන්තරේ. දැන් මට පරණ ගෙදරත් මතක් වෙනවා. මේ වනාන්තරයෙන් මිදිලා මට කොහේ හරි යන්න තිබ්බනම් කියලා තමයි මං හිතන්නේ. නත්තල් සීයා මට තෑග්ගක් දීලා සුභ නත්තලක් කියලා යන්න ගියා. ටීෂා ඒ තෑග්ග ඇරලා බැලුවා. ඒකෙ තිබුණේ පලසක්. ටීෂා බැලුවා ඇයි මට මේ පලසක් කියලා. ඒ පලස කතා කරනවා.ඒ පලස ඇසුවා ඔයාට කොහාටද යන්න ඕනේ කියලා. ටීෂා කිව්වා මට මේ වනාන්තරයෙන් මිදිලා මං හිටපු තැනට හරි වෙන කොහාට හරි මට යන්න ඕනේ කියලා. ඉතින් මේ පලස රාජමාලිගාවක් අසලට ඇරගෙන ගියා.



# ටීෂා සහ කුමාරයා

දැන් අර ටීෂා අර පලසෙන් ඒ රජ මාලිගාවේ සොඳුරුතලයට ගියා. ඉන්පසු එතන හිටපු සෙබල දෙන්නෙක් මේ ටීෂාව අල්ලගත්තා. අනේ මට මුකුත් කරන්න එපා මං හොරකම් කරන්න නෙවෙයි ආවේ කියලා ටීෂා කිව්වා. ඊට පස්සේ හෙට උදෑසනින්ම රජු ගාවට මේ ටිෂා එක්කන් ගියා. රජු මෙයාට මරණ දණ්ඩනය නියම කරා. එහෙම කරද්දි එක පාරටම මේ කුමාරයා දුවගෙන ඇවිල්ලා මේ ටීෂාගේ ඇඟේ හැප්පුනා. මේ කුමාරයාට මේ ටීෂාව දැකලා ආදරයකුත් හිතුනා.මේ කුමාරයා ටීෂාගේ ලස්සන දැකලා ඒකට වශී උනා. මේ කුමාරයා තම තාත්තාට කිව්වා අනේ තාත්තේ මෙයාව මම විවාහ කරගන්නවා. මෙයා හරිම රූමත්. මම මෙයාව විවාහ කරගෙන හොඳ ජීවිතයක් ගත කරනවා කියලා කුමාරයා කිව්වා.ටීෂාට හරිම සතුටුයි. මේ දෙන්නගේ විවාහ උත්සව උත්සවාකාරයෙන් පැවැත්වුණා.මේ දෙන්නා සතුටින් කාලය ගත කරා.